# ශ්‍රී මහා බෝධි පුද සිරිත්: සමකාලීන ස්ථාපන කලා දෘෂ්ටිකෝණයෙන් විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්. ටී. එස්. කේ. පීරිස්[1]

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය කලාව සහ ආගම අතර සිදු කරන බොහෝ කතිකාවන්හි දකින්නට ලැබෙන මූලික ලක්ෂණය වනුයේ ඒ සමාජ සංස්ථාවන් දෙක අතර පවතින අවියෝජනීය සම්බන්ධතාවකි. එමනිසා අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිළිබඳ අධ්‍යයනය කරන විට එය ලංකාවේ වසර දෙදහසකට වැඩි කාලයක් පුරා ගෞරවයට පාත්‍ර වූ බෞද්ධ ලාංඡනයකි. මෙය ලංකා ඉතිහාසය හා සංස්කෘතිය සමග සංකීර්ණ ලෙස බැඳී ඇත. ශ්‍රී මහා බෝධිය සහ ඒ සමාජ සංස්කෘතික අවකාශය වටා ගොඩ නැගුණු සමාජ සාරධර්ම, විවිධ වූ පුද පූජා, චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත්, සංස්කෘතික අංග හා මානව ක්‍රියාකාරකම් රැසක් සමග දීර්ඝ කාලයක් බැඳී පවතින ඓතිහාසික, කලාත්මක වැදගත්කමක් ඇති ස්ථානයකි.

එනම් මල් පූජාවන්, පහන් පූජා හෝ විදුලි පහන් දල්වා ආලෝක පූජා කිරීම, ගිලන්පස පූජාව, බුද්ධ පූජාවට අනුකූලව පැන්, පළතුරු හා වෙනත් ආහාර පූජා කිරීම, පිරිසිදු ජලය පූජා කිරීම, ධජ පූජාව, බෞද්ධ කොඩි හෝ පූජාධජ පූජා කිරීම එමෙන්ම විවිධ අපල දුරුවීම සඳහා කොඩි වැල් එල්ලීම, පිරිත් සජ්ඣායනය සහ පිරිත් ශ්‍රවණය, ශබ්ද පූජා පැවැත්වීම, ආරක්ෂාව හා ආශිර්වාදය අපේක්ෂාවෙන්, බෝධි පූජා ගාථා, පිරිත් හා පුද පූජා සමග විශේෂ බෝධි පූජාව පැවැත් වීම. ශ්‍රී මහා බෝධිය වටා දක්ෂිණාවර්තව ගමන් කරමින් වන්දනා කිරීම, ගාථා සජ්ඣායනා කර නමස්කාර කිරීම, භාවනා කිරීම, දාන, සිවුරු, ගිලන්පස හා අනෙකුත් පිරිකර පූජා කිරීම, සෙත් පැතීම, ප්‍රාර්ථනා ඉටු වූ පසු පූජා පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් රාශියක් මේ ආශ්‍රිතව සිදු වේ.

ඒ අනුව, ශ්‍රී මහා බෝධීන් වහන්සේ ආශ්‍රිතව සිදු කෙරෙන මිනිසුන්ගේ එම ක්‍රියාකාරකම් දෙස සමකාලීන කලා පර්යේෂකයකු ලෙස බැලීමේදී එයින් දහනම වන ශත වර්ෂයේ පැවැති සාම්ප්‍රදායික නීති පද්ධතියක් තුළ සිර වී සිටි ශාස්ත්‍රාලීය කලාවේ සීමාකම් තුළින් ඉදිරියට පැමිණි සමකාලීන කලාවක් වන ස්ථාපන කලාවේ (Installation Art) යම් යම් ලක්ෂණ නැතිනම් නිර්නායකයන් මෙම ක්‍රියාකාරකම් ඒ හා සමග බැඳී පවතින බව පෙනී යයි. මේ අනුව ඓතිහාසික බෞද්ධ ස්මාරකයක් වන ශ්‍රී මහා බෝධිය සමකාලීන කලා දෘෂ්ටිවාදයට අනුව, මේ තුළ යම් යම් ස්ථාපනමය කලා ලක්ෂණ ගණනාවක් පෙන්නුම් කරනු ලබයි. එම නිසා ඓතිහාසික බෞද්ධ සංස්කෘතික වස්තුවක් වන ශ්‍රී මහා බෝධිය වර්තමානයේ ඒ ආශ්‍රිතව සිදු කෙරෙන විවිධ වූ මෙම මානව ක්‍රියාකාරකම් ආගමික සන්දර්භයෙන් වියුක්තව බැලූ විට එය සමකාලීන ස්ථාපන කලාවේ අවකාශය, ප්‍රේක්ෂක නියැලීම, සංකල්පීය අභිප්‍රාය, ද්‍රව්‍ය හා තාක්ෂණය, තාවකාලික මූලද්‍රව්‍ය, සංස්කෘතික සමාජ සන්දර්භය, සහයෝගීතාව වැනි ස්ථාපන කලා ලක්ෂණ විමර්ශනය කළ හැකිය.

1 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය, ශ්‍රී ලංකාව. sewwandikaushani888@gmail.com

ඒ සඳහා මූලික වශයෙන් ගුණාත්මක දත්ත ක්‍රම වේදය භාවිත කරනු ලබයි. මෙම දත්ත  මත පදනම්ව ශ්‍රී මහා බෝධිය ස්ථාපන කලා කෘතියක් ලෙස සැලකිය හැකිද? යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. ශ්‍රී මහා බෝධිය සැබැවින්ම වෙනස් වන සජීවී කලා අවකාශයක් ලෙසද හඳුනාගත හැකිද? යන්න මෙම ගැටලුව තුළින් සොයා බලයි. මේ අනුව ශ්‍රී මහා බෝධිය සාම්ප්‍රදායික ආගමික උරුමයක් පමණක්ද, නැතහොත් ස්ථාපන කලා සංකල්ප සමග සම්බන්ධ වන කලා නිර්මාණයක්ද යන්න මෙම පර්යේෂණයේ මූලිකව අධ්‍යයනය වන අතර ශ්‍රී ලංකාවේ දේශීය කලා උරුමයන් නව කලා විචාරාත්මක දෘෂ්ටියකින් අර්ථකථනය කිරීමටද, ස්ථාපන කලා න්‍යායන්  පැරණි දේවල් පිළිබඳව විශ්ලේෂණයට භාවිතා කරන්නේ කෙසේද යන්න ඉදිරිපත් කිරීම පිළිබඳව නව අදහසක් ගැනීමට ද මෙම පර්යේෂණය වැදගත් වේ.

**ප්‍රධාන අරමුණු**

- ස්ථාපන කලාවේ ඇති න්‍යායන් නිවැරදි ලෙස හඳුනා ගැනීම
- මෙම අලුත් සංකල්ප (න්‍යායන්) පද්ධතිය පැරණි දේවල් පිළිබඳව විශ්ලේෂණයට භාවිතා කරන්නේ කෙසේද යන්න ඉදිරිපත් කිරීම
- ශ්‍රී මහා බෝධියේ ඉතිහාසය, අරමුණු, විවිධ වූ පුද පූජා, චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත්, සංස්කෘතික අංග පිළිබඳව සොයා බැලීම
- ආගමික චාරිත්‍ර තුළ පවතින දෘශ්‍ය කලාමය ලක්ෂණ හඳුනා ගැනීම
- ශ්‍රී මහා බෝධිය තුළින් හෙළිවන ස්ථාපන කලා ලක්ෂණ අධ්‍යයනය කිරීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා මූලික වශයෙන් ගුණාත්මක දත්ත ක්‍රම වේදය භාවිත කර ඇත. අධ්‍යයන ක්‍රම වේදය ලෙස මූලික විශ්ලේෂණ ක්‍රම දෙකක් යොදා ගැනීම.

**ආකෘතිවාදී අධ්‍යයන ක්‍රමය**

දෘශ්‍ය කලා ව්‍යාකරණ සමූහයක් දෘශ්‍ය මූලධර්ම ඔස්සේ යම්කිසි කලා කෘතියක් ගොඩනගා ඇති ආකාරය ආකෘති ගොඩ නැගීම ලෙස හැදින්විය හැක. මෙහිදී මූලිකවම සිදුවන්නේ කලා කෘතියක් තුළ දක්නට ලැබෙන දෘශ්‍ය මූලිකාංග පිළිබද අධ්‍යයනය කර විචාරය ගොඩ නැගීමයි.

**සන්දර්භය අධ්‍යයන ක්‍රමය**

මෙම අධ්‍යයනය ක්‍රමය තුළ කලා කෘතියේ අකෘතිය පිළිබද අධ්‍යයනයේ නිරත වනවාට වඩා අන්තර්ගතය දෙස අවධානය යොමු කෙරේ. (නිදසුන් ලෙස මතවාද, කලා කෘතිය ගොඩනන් වන සමාජ, දේශපාලනික, ආගමික සන්දර්භයන්).

පර්යේෂණයේ දත්ත එක් රැස් කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය උපයෝගී කරගනු ලබයි.

ප්‍රාථමික මූලාශ්‍රය - ක්ෂේත්‍ර අධ්‍යයන සහභාගිත්ව නිරීක්‍ෂණයන් සිදුකිරීම සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.

ද්විතීයික මූලාශ්‍රය - අදාළ විෂය අළලා රචනා වී ඇති ග්‍රන්ථ ලිපි සහ සඟරා ආදිය පරිශීලනය කිරීම.

**ප්‍රතිඵල හා සකච්ඡාව**

සමකාලීන කලා භාවිතයක් වන ස්ථාපන කලාව විසිවන සියවසෙහි සම්ප්‍රදායික සිතුවම් හා මූර්ති කලාවේ සීමාවන් ඉක්මවා වර්ධනය වූ සමකාලීන කලාවක් ලෙස හඳුනාගත හැකිය. යුරෝපය හා ඇමරිකාවෙන් ආරම්භ වූ මෙම කලා ආකෘතිය ආසියාව ඇතුළු ලෝකයේ විවිධ ප්‍රදේශවලට ව්‍යාප්ත වූ අතර, දේශීය සංස්කෘතිය, දේශපාලනය, සමාජ ගැටලු සහ පාරිසරික කරුණු ප්‍රකාශ කිරීම සඳහා භාවිතා කරන ලදී. ශ්‍රී ලංකාව තුළද 1990 දශකයෙන් පසු සමකාලීන කලාකරුවන් විසින් ස්ථාපන කලාව භාවිතා කරමින් යුද්ධය, සංස්කෘතිය සහ සමාජ අත්දැකීම් පිළිබඳ නව කලා ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. උදාහරණ- "බැරලිසම්'' ජන්ද ගුප්ත තේනුවර, "අහිංසකයන්ගේ ආරාමය'' ජගත් වීරසිංහ.

මෙලෙස ආරම්භ වූ ස්ථාපන කලාවේ නිර්ණායක (ලක්ෂණ) කිහිපයක් හඳුනාගතත හැකි වේ. එනම් ප්‍රේක්ෂක සහභාගීත්වය, සංකල්පීය අභිප්‍රාය, ද්‍රව්‍ය සහ තාක්ෂණය, තාවකාලික මූලද්‍රව්‍ය, සංස්කෘතික සහ සමාජීය සන්දර්භය සහ සහයෝගීතාවය හඳුනාගත හැකිය. මෙම ලක්ෂණ බැලීමේදී ස්ථාපන කලාව සමකාලීන කලා භාවිතයක් වුවද එහි නිර්ණායකයන් අප ඉතිහාසයේ පැරණි විවිධ ආගමික සන්දර්භයන් තුළ බිහි වූ විවිධ නිර්මාණවල භාවිතා වී ඇත. ඒ අනුව ශ්‍රී ලාංකේය කලා ඉතිහාසයේ ඓතිහාසික බෞද්ධ ස්මාරකයක් වන ශ්‍රී මහා බෝධිය ආශ්‍රිතව සිදු කෙරෙන එවිට පුද පූජා සිරිත් විරිත්, විමර්ශනය කිරීමේදී මිනිසුන්ගේ යම් කිසි ක්‍රියාකාරකම් ඒ හා සමග බැඳී පවතී. තවද ඒවා වර්තමානය වන විට නිර්මාණාත්මක අංගයන් බවට පත්වී ඇත. ඒ හේතුවෙන් ශ්‍රී මහා බෝධිය ආශ්‍රිතව සමකාලීන දෘෂ්ටිවාදයට අනුව මේ තුළ යම් යම් ස්ථාපනමය කලා ලක්ෂණ ගණනාවක් පෙන්නුම් කරනු ලබයි. ඒ බව ශ්‍රී මහා බෝධිය ආශ්‍රිතව සිදුකෙරෙන මානව ක්‍රියාකාරකම් කිහිපයක් ඇසුරින් සාකච්ඡා කළ හැකිය.

පහන් පූජාව (ආලෝක පූජාව) - මෙය සෞන්දර්යාත්මක බවින් අලංකාර සිදුවීමක් වේ. අතීතයේදී පහනක් දැල් වුවද වර්තමානයේදී තාක්ෂණික දියුණුවත් සමඟ නිර්මාණාත්මකව එය වර්ධනය වී ඇත. එම නිසා මිනිසුන්ගේ මැදිහත්වීම අවකාශ භාවිතය. (විවිධ රටාවන්වලට පහන් දැල්වීම, විදුලි පහන් දැල්වීම) මිනිසුන්ගේ සහභාගීත්වය ඔවුන් අතර ඇති අන්තර් සබඳතාව, සංකල්පීය අභිප්‍රාය, නිශ්චිත කාල සීමාවකට සීමා (රාත්‍රී කාලයේදී විවිධ වූ අවකාශයන් මැවීම) වැනි ස්ථාපන කලා ලක්ෂණ එයින් ජනිත වේ. උදාහරණයක් ලෙස වෙසක් පෝය දිනවල ශ්‍රී මහා බෝධිය වටා දැල්වෙන තෙල් පහන් දහස් ගණනක් සලකා බැලිය හැක. එය ආලෝකය මගින් අවකාශය වෙනස් කරන තාවකාලික ස්ථාපනයක් ලෙස හැඳින්විය හැක. පහන් පේළි,

ගිනි දැල්වීම්, ආදියෙහි සමකාලීන කලාකරුවෙකුගේ ස්ථාපන කලාකෘති ලක්ෂණ සමාන වේ. වෙනස වන්නේ මෙය සම්ප්‍රදායික ජනතාව විසින් පරම්පරාගතව නිර්මාණය කරනු ලබන සජීවී අත්දැකීමක් වීමයි.



පහන් පූජාව



මල් විවිධ වූ අවකාශයන් ගොඩනැගීම



මල් පූජා කිරීම - සරල පූජා විධික්‍රමයක් වන මල් පූජා කිරීම ගත් විට එය විවිධ වූ අවකාශයන් පරිසරය තුළ ගොඩනැගීමට සමත් වේ (පැහැය හා වර්ණය තුළින් විවිධ අවකාශීය රටා මවයි). මල්වලින් පැතිරෙන සුගන්ධයේ මිනිසුන්ගේ සිත් ඇද-බැඳ තබා ගන්නා අතර මිනිසුන් ස්මාරකය සමග සම්බන්ධ වන ආකාරය එම අමුද්‍රව්‍ය හැසිරවීම මගින් එම අවස්ථා ස්ථාපනමය ස්වරූපයක් දරනු ඇත.

සුවඳ දුම් පූජාව - සුවඳ දුම් පූජා කිරීමේදී අවකාශය පුරා පැතිර යන දුමාරය එම අවකාශය අත්පත් කර ගනී සැදැහැවතුන් එම දුමාරය අතරින් ගමන් කිරීම ඔවුන් සුවඳ දුන් දැල්වීම තුළින් ඔවුන් මෙම ක්‍රියාවලියේ සමග සම්බන්ධ වීම එයින් වෙනස් වන්නා වූ පරිසරයක් මැවීමට සමත්වේ. එහිදී මිනිසාගේ මැදිහත්වීම හරහා මෙහි ස්ථාපනමය කලා අවකාශයක් ගොඩනැගීමට හේතු වේ.

ශ්‍රී මහා බෝධිය වටා පිහිටි පූජා භූමිය නිර්මාණාත්මකව සකස් වූ ආගමික ස්ථානයක් වන අතර, එය නරඹන්නාගේ ගමන් මාර්ගය, නතර වීම හා අවධානය යොමු වන ස්ථාන පාලනය කරයි. සමකාලීන ස්ථාපන කලාවේදී ද ප්‍රේක්ෂකයාට නිශ්චිත අත්දැකීමක් ලබාදීමට අවකාශ සැලසුම් කෙරේ. මෙහි වන්දනාකරුවා කලාගාරයක ප්‍රේක්ෂකයෙකු මෙන් පමණක් නොව, කෘතියේම කොටසක් බවට පත්වේ. ඔහුගේ හෝ ඇයගේ ගමන් කිරීම, වඳින ඉරියව්, හා පූජා ද්‍රව්‍ය තැබීම මගින් කෘතිය නිරන්තරයෙන් වෙනස් වේ.



කොඩි වැල් එල්ලීම



ගමන් කිරීම, වඩින ඉරියව් හා පූජා ද්‍රව්‍ය තැබීම



ඒ අනුව, ශ්‍රී මහා බෝධි පුද සිරිත් සාම්ප්‍රදායික ආගමික චාරිත්‍රයක් ලෙස පමණක් නොව, සජීවී සමකාලීන ස්ථාපන කලා කෘතියක් ලෙසද විමර්ශනය කළ හැක. එය භෞතික වස්තු, ආලෝකය, ශරීරය, සහ සාමූහික අත්දැකීම එක් කරමින් පරම්පරා ගණනාවක් පුරා නිර්මාණය වන සංස්කෘතික කලා භූමියකි.

## නිගමනය

බෞද්ධ ආගමික ස්මාරකයක් වන ශ්‍රී මහා බෝධිය හා බැඳුණු විවිධ වූ සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර සහ සංස්කෘතික ක්‍රියාකාරකම් (ඈත අතීතයේ පටන්ම) රාශියක් ඇත. වර්තමානයේදී එම සංස්කෘතික ක්‍රියාකාරකම් නිර්මාණශීලී බව සහ මිනිසා ඒ සමග සම්බන්ධ වන ආකාරය අධ්‍යයනය කිරීමේදී කිරීමේ දී එය ස්ථාපන කලා ලක්ෂණ පෙන්නුම් කරනු ලබයි. එම නිරීක්ෂණ මත පදනම්ව ශ්‍රී මහා බෝධිය ආගමික සන්දර්භයෙන් වියුක්තව බැලූ විට ඒ ස්ථාපන කලා කෘතියක් බවද එමගින් නිර්මාණාත්මකව සංස්කෘතිය සන්නිවේදනය කිරීම සිදුවන බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** - බෝධිය, බෞද්ධ, සංස්කෘතිය, සමකාලීන ස්ථාපන

## ආශ්‍රිත ග්‍රන්ථ

දිසානායක, ජේ.බී. (1997). *ශ්‍රී මහා බෝධීන් වහන්සේ.* කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මරක්ඛිත හිමි, වැලිවිටියාව. (1994). *ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා තදානුබද්ධ සංස්කෘතිය.* කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ස්වර්ණසිංහ, කේ.එම්.අයි. (2005). *අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය,* වාග් ප්‍රකාශන.

ආරච්චිගේ, ෂෙල්ටන්. (2000). *ශ්‍රී ලංකාවේ නූතන චිත්‍ර මූර්ති කලාවේ නව ප්‍රවණතා.* කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඉලංග සිංහ, සත්සර. (2017). *පශ්චාත් නව්‍ය වාදය සහ චිත්‍ර ශිල්පියා.* පන්නිපිටිය: ටැෆර්ට් ලේක් පුද්ගලික සමාගම.

කරුණානන්ද, උක්කු බණ්ඩා. (1994). *අනුරාධපුර අටමස්ථානය ශ්‍රී ලංකා.* ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන්.

පරණවිතාන, ඇස්. (1963). *ලංකාවේ ස්තූප.* කොළඹ 7: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ප්‍රකාශන අංශය.

පෙරේරා, අනෝලි. (2007). *ශ්‍රී ලාංකේය කලාකාරිනියෝ* පිට කෝට්ටේ.

ArcherMichael. (1997). *Art Since& 1960*. Thamesand hudson & London.